# නුවරඑළිය ප්‍රාදේශීය සභාව
# නුවරඑළිය දිස්ත්‍රික්කය

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 17 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 09 දින ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.3,167,335ක උසාවි දඩ ආදායම රු.12,452,309ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් රු. 9,284,974 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාළ රු.8,386,668ක මුද්දර ගාස්තු ආදායම රු.3,711,479ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.4,675,189ක් අඩුවෙන් දක්වා තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.2,515,313ක මුද්දර ගාස්තු රු.3,711,479ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් රු.1,196,166ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාළ රු.156,576 ක විගණන ගාස්තුව මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොවීම නිසා ජංගම වගකීම් එම ප්‍රමානයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ). ඉකුත් වර්ෂ වෙනුවෙන් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල් වශයෙන් ගෙවිය යුතු රු.3,297,221ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය අවසානයට කඳපොල උපකාර්යාලයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ). පළාත් පාලන ගිණුම් ක්‍රමය අනුව එක් එක් වැය විෂයන්වල හා එක් එක් ආදායම්විෂයන්වල ගෙවීම් හා ලැබීම් සාරාංශගත ලේඛනවලින් ලබාගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මුදල් පොත හා ලැබීම් ගෙවීම් ගිණුම් සම්බන්ධකරමින් සාවද්‍ය ජනල් සටහන් 19ක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර තිබුණි.

(උ). මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉකුත් වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දෙන ලද රු39,561,187ක් වටිනා ගිණුම්කරණ අඩුපාඩු 5ක් ප්‍රවර්තන වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්.

-----------------------------

සභාවේ පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම් 10ක ශේෂයන් හා අදාළ උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු. 42,506,462ක නොසැසඳීමක් විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම්.

--------------------

2014 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.67,129.574 ක් විය.

1.3.5 ලැබිය යුතු ගිණුම්

--------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.35,500,472ක් වූ අතර ඒ තුළ වසරක කාලයක් ඉක්මවූ ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.6,737,200ක් විය.

1.3.6 ගෙවිය යුතු ගිණුම්

---------------------

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු83,939,875ක් වූ අතර ඒ තුළ වසරක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.71,805,939ක් වී තිබුණි.

1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම.

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.114,271,974ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි විය.

1.3.8 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.6 වගන්තිය | සභාවේ සේවයේ නියුක්තව සිටි සේවකයන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු111,932ක සේවක ණය දීර්ඝ කාලයක සිට අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

(ආ). <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>

(i). මු.රෙ. 396 (ඇ) — 2014 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06ක් ඉක්මවූ රු22,335ක් වටිනා චෙක්පත් 05ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

(ii). මු.රෙ. 371 — අවස්ථා 76 කදී ලබාදුන් රු.1,272,136 ක් වටිනා අත්තිකාරම් පියවා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,505,649 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,136,840ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,631,191 ක පිරිහිමක් නිරික්ෂණය විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු. 33,049,430ක පිරිහීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා ආදායම් විෂයයන් 03ක අඩුවීම හා වියදම් විෂයයන් 03ක වැඩිවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014.01.01 දිනට හිඟ ආදායම | 2014 වර්ෂයේ බිල්කළ ආදායම | 2014 වර්ෂය තුළ එකතු කළ යුතු මුළු ආදායම | ආදායම් එකතු කිරීම | | | හිඟ ආදායම | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2014.01.01 දිනට හිඟ ආදායමෙන් | 2014 බිල්කළ ආදායමෙන් | එකතු කළ මුළු ආදායම | 2014.01.01 දිනට හිඟ ආදායමෙන් | 2014 බිල්කළ ආදායමෙන් | මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 5,088,074 | 4,591,701 | 9,679,775 | 2,473,329 | 2,558,148 | 5,031,477 | 2,033,553 | 2,614,745 | 4,604,968 |
| අක්කර බදු | 278,641 | 200,724 | 479,365 | 189,451 | 209,416 | 398,867 | (8,692) | 89,190 | 80,499 |
| බලපත්‍ර ගාස්තු | 0 | 4,044,000 | 4,044,000 | - | 4,044,000 | 4,044,000 | 0 | - | - |
| ගෙවල් කුලී | 147,421 | 203,072 | 350,493 | 23,027 | 175,398 | 198,425 | 124,394 | 27,675 | 152,069 |
| කඩ කුලී | 290,026 | 437,523 | 727,549 | 209,600 | 262,337 | 471,937 | 175,186 | 80,427 | 255,612 |
| ඉඩම් බදු | 251,743 | 78,070 | 329,813 | 60,239 | 53,580 | 113,819 | 24,490 | 191,503 | 215,994 |
| සතිපොල | 220,130 | 783,417 | 1,003,547 | 220,130 | 779,042 | 999,172 | 4,375 | - | 4,375 |
| ජල ගාස්තු | 1,352,798 | 1,904,217 | 3,257,015 | 1,085,965 | 779,524 | 1,865,489 | 1,124,693 | 266,833 | 1,391,526 |
| මස් කඩ කුලී | 876,298 | 3,322,935 | 4,199,233 | 750,286 | 3,119,394 | 3,869,680 | 203,541 | 126,012 | 329,553 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් වටිනාකම රු.16,163,788ක් විය.

2.3.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

-----------------------

වසර ආරම්භයේ විධිමත් සමීක්ෂණයක් කර ඒ අනුව වෙළඳ බලපත්‍ර ගාස්තු බිල්කර අයකිරීම වෙනුවට සභාව විසින් එකතු කරනු ලැබූ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම් පමණක් බිල්කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා පිළියෙල කර තිබූ පාලන වාර්තා මගින් භෞතික හා මූල්‍ය කාර්යය සාධනය සංසන්දනය කිරීමට නොහැකි විය.

3.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.259,960ක් වටිනා ටයර් සහ බැටරි සඳහා වෙළඳපොල වටිනාකම ඉක්මවා රු.50,660ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ). සභාවට එරෙහිව පනවා තිබෙන නඩුවකට අදාළව අවස්ථා 03කදී ගෙවා තිබූ රු.103,500ක මුදල තුළ නඩුව විභාග කළ දින 06ක් සඳහා නැවත නැවත ගෙවීම් කිරීම හේතුවෙන් රු.54,000ක මුදලක් වැඩිපුර ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ). සභාවට අයත් අංක CPPB-6635 දරන වාහනය සඳහා 2014 ජුලි මාසයෙන් අවසන් වන වර්ෂයට අදාළව ආදායම් බලපත්‍ර ලබාගැනීම වෙනුවෙන් ඉදිරිපත්කල රු.12,200ක් වටිනා ආදායම් බලපත්‍රය සඳහා අත්තිකාරම් පියවීමේ වවුචර් 02ක් ඉදිරිපත්කර රු.12,200ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

(ඈ). ප්‍රාදේශීය සභාව මීපිළිමාන මාතෘ සායනය සඳහා ආවරණකුටියක් ඉදිකිරීමේ කර්මාන්තයේදී, එකම වැඩ විෂයයන් සඳහා අවස්ථා 02කදී බිල්පත්‍ර පිළියෙලකර රු.183,462ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

ව්‍යාපෘති 19ක වැඩ ආරම්භ කිරිම් සඳහා රු. 891,150 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටද වැඩ නිමකර නොතිබුණි.

3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

නානුඔය සහ කඳපොල නගරවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිකර පරිදි කසළ බැහැර කරමින් තිබූ බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

------------------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය.

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම්, වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 05ක සියයට 10සිට සියයට 64 දක්වාද වියදම් විෂයයන් 05ක සියයට 26 සිට සියයට 160 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.3 අභ්‍යන්තර විගණනය

-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). අභ්‍යන්තර පාලනය.

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). ණයගැති ණයහිමි පාලනය.

(ඉ). වත්කම් කළමනාකරණය